# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/68/01/21

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.03. 21

**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**

**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**

**සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්**

**<u>කෙටි කාලීන පෞද්ගලික විදේශ නිවාඩු අනුමත කිරීමේ බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දීම</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතනවල (ජාතික පාසල්, විද්‍යාපීඨ, රජයේ ගුරු විද්‍යාල, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන වැනි) සේවය කරන දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා හා ඇතැම් දෙපාර්තමේන්තු ගත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා මෙම අමාත්‍යාංශය මඟින් කෙටි හා දීර්ඝ කාලීන පෞද්ගලික විදේශීය නිවාඩු අනුමත කිරීම, දීර්ඝ කිරීම, අවලංගු කිරීම හා සංශෝධනය කිරීම සිදු කරනු ලබයි.

02. එහෙත්, දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි ඉහත සඳහන් අධ්‍යාපන ආයතනවල ආයතන ප්‍රධානීන් මඟින් , විවිධ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු, හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු හරහා මෙම අමාත්‍යාංශය වෙත නිවාඩු ඉල්ලුම් පත්‍ර ලැබීමට සැලකිය යුතු කාලයක් ගත වන බවත්, ඇතැම් අවස්ථාවල පරිපාලනමය දෝෂ සහ අදාළ වෙනත් තොරතුරු ඉල්ලා සිටීම හේතුවෙන් විදේශගත වන දින වන විටත් විදේශ නිවාඩු ඉල්ලුම් පත්‍ර අමාත්‍යාංශය වෙත ලැබී නොමැති වීම නිසා නිලධාරීන් මහත් අපහසුතාවට පත්ව ඇති බව නිරීක්ෂණය වී ඇත.

03. ඒ අනුව, සියලුම පළාත්, කලාප, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවල මධ්‍යම රජයේ සේවයේ නියුතු හා ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ගුරු උපදේශක සේවය හා සියලුම ජාතික පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ විදේශ නිවාඩු අනුමත කිරීම සම්බන්ධව පවතින විධිවිධානයන්ට යටත්ව සහ ඒ සම්බන්ධයෙන් වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, චක්‍රලේඛ ලිපි හා කාලීනව නිකුත් කරන අනෙකුත් විධිවිධාන ප්‍රකාරව මාස 06 ක් දක්වා වන කෙටි කාලීන විදේශ නිවාඩු අනුමත කිරීම, දීර්ඝ කිරීම, අවලංගු කිරීම හා සංශෝධනය කිරීමේ බලය වහාම ක්‍රියාත්මක වන පරිදි සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලබන බව කාරුණිකව දන්වමි.

04. එසේ වුවත්, එම නිලධාරීන්ගේ මාස 06 ට වැඩි දීර්ඝ කාලීන විදේශ නිවාඩු අනුමත කිරීම, දීර්ඝ කිරීම, අවලංගු කිරීම හා සංශෝධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු බව දන්වමි. එසේම, අදාළ විදේශ නිවාඩු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයෙන් විමසන ඕනෑම අවස්ථාවකදී ඒ සම්බන්ධව නොපමාව තොරතුරු ලබා දිය හැකිවන පරිදි සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගන්නා මෙන් ද දන්වමි.

05. එමෙන්ම, ඉහත 03 ඡේදය යටතේ විස්තර කළ නිලධාරීන් හැර අනෙකුත් සේවාවන්ට අයත් වන නිලධාරීන්ගේ සියලු පෞද්ගලික විදේශ නිවාඩු සම්බන්ධ අනුමැතිය, දීර්ඝ කිරීම, අවලංගු කිරීම හා සංශෝධනය කිරීම සඳහා තවදුරටත් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුවන බව ද වැඩිදුරටත් දන්වමි.

අත්/ කළේ : වසන්තා පෙරේරා
අධ්‍යාපන ලේකම්

එච්. නීලක්ෂි එන්. ගුණසේකර
අතිරේක ලේකම් (පාලන)